# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2022

### 2025 ජූලි

### මානවශාස්ත්‍ර පීඨය

## නාට්‍ය හා රංගකලාව

**(නව නිර්දේශය)**

**යුරෝපීය සහ ඇමරිකානු නාට්‍ය කලාව DMAT 38214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. (අ) නූතන යුගයේ පැන නැගුණු සමාජ, දේශපාලන ලක්ෂණ හඳුන්වා දෙමින් ඒවායේ බලපෑම් මත බිහිවූ නූතන යුගයේ නාට්‍ය ශානර මොනවාදැයි පැහැදිලි කරන්න. (ලකුණු 20)

නැතහොත්

(ආ) "නූතන යුගය ආරම්භයේ දී ඇති වූ සමාජ, දේශපාලන සහ ආර්ථික විපර්යාස නූතන යුගයේ නාට්‍ය සඳහා ප්‍රබල තේමා සපයා ඇත." නූතන යුගයේ රචනා කෙරුණු නාට්‍ය පිටපත් තුනකින් නිදසුන් දක්වමින් ඒවායේ ඇතුළත් නූතනවාදී තේමා මොනවාදැයි විමර්ශනය කරන්න. (ලකුණු 20)

02. නූතන යුගයට පෙර පැවති නාට්‍ය කලාව සහ නූතන යුගයේ නාට්‍ය කලාව පිළිබඳ නිදසුන් සහිතව සංසන්දනාත්මක විග්‍රහයක් කරන්න. (ලකුණු 20)

03. නූතන යුරෝපයේ බිහි වූ යථාර්ථවාදී නාට්‍ය කලාව පිළිබඳ ව පුවත්පතක පළ කිරීමට සුදුසු ලිපියක් සම්පාදනය කරන්න. (ලකුණු 20)

04. පහත දැක්වෙන නාට්‍ය කෘති අතරින් එක් කෘතියක් උදාහරණ වශයෙන් ගෙන එහි කේවල පුද්ගලයා (Individual Person) නිරූපණය කෙරෙන ආකාරය සාකච්ඡා කරන්න. (ලකුණු 20)

(අ) බෝනික්කි ගෙදර (A Doll's House)

(ආ) පුනරාගමනය (Ghosts)

(ඇ) ජනහතුරා (An Enemy of the People)

05. චෙරිවත්ත (The Cherry Orchard) නාට්‍යයේ චරිත සහ චෙරිවත්ත අතර ඇත්තේ කවර ආකාරයේ සම්බන්ධතාවන් දැ යි උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 20)

06. පහත දැක්වෙන නාට්‍ය ශානර දෙකක් තෝරාගෙන ඒවායේ සුවිශේෂී ලක්ෂණ පිළිබඳ වෙන් වෙන් වශයෙන් සවිස්තරාත්මක සටහන් ලියන්න.

(අ) රෝමාන්තිකවාදය (ආ) ඇබ්සර්ඩ් නාට්‍ය

(ඇ) එපික් නාට්‍ය (ඈ) කුරිරු රංගය

(ඉ) දිළිඳු රංගය (ලකුණු 10x2=20)

07. (අ) සාන්ද්‍රෘෂ්ටිකවාදය යනු කුමක්දැ යි පෙන්වා දෙන්න. (ලකුණු 08)

(ආ) යුරෝපීය හෝ ඇමරිකානු නාට්‍යයක් උදාහරණ වශයෙන් ගෙන සාන්ද්‍රෘෂ්ටිකවාදී නාට්‍යවල ලක්ෂණ මොනවාදැ යි පෙන්වා දෙන්න. (ලකුණු 12)

08. (අ) ඇමරිකානු සිහින සංකල්පය කුමක්දැ යි හඳුන්වා දෙන්න. (ලකුණු 05)

(ආ) ආතර් මිලර්ගේ හෝ ටෙනසි විලියම්ස්ගේ නාට්‍ය නිර්මාණ ඇමරිකානු සිහින (American Dream) සංකල්පයට ප්‍රතිවිරෝධය දක්වමින් ගොඩනැංවූ ආකාරය උදාහරණ දක්වමින් විවරණය කරන්න. (ලකුණු 15)

****************************